**කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය,**

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018**

**PSC 2226 - සමාජ විද්‍යා පර්යේෂණ විධික්‍රම**

**කාලය: පැ දෙකයි(02)**

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයකට උපරිම **ලකුණු 20කි.**

---

1. (අ) "වාස්තවික" (objectivist) සහ "මනෝමූලික" (subjectivist) ඥාන මීමංසා (epistemology) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

   (ආ) දේශපාලන විද්‍යාඥයෝ තම විශ්ලේෂණයන් සඳහා ජාතිකත්වය වැනි සංකල්ප කෙරෙහි අවධානය යොමු කරති. ඔබ ජාතිකත්වය සංකල්පයක් අධ්‍යයනය කරන්නේ නම් ඒ සඳහා වඩාත්ම සුදුසු ඥාන මීමංසාමය ප්‍රවේශය කුමක්ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

2. (අ) ඥාන සම්පාදන ඉතිහාසය දේවවාදී (theological), පාරභෞතික (metaphysical) සහ විද්‍යාත්මක (scientific) වශයෙන් අවධි තුනකින් දැක්විය හැක. මෙම අවධි තුන අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

   (ආ) උදාහරණ භාවිත කරමින් උද්ගාමී (inductive) හා නිගාමී (deductive) තර්කණයන්හි වෙනස පැහැදිලි කරන්න.

3. (අ) අනුභූතවාදය (empiricism) යනු කුමක්ද යන්න කෙටියෙන් සාකච්ඡා කරන්න.

   (ආ) විශ්වාසාත්මක ඥාන සම්පාදනය සඳහා පාරභෞතිකවාදී (metaphysical) හෝ දේවවාදී (theological) ක්‍රමවලට වඩා අනුභූතවාදය සුදුසු යැයි ෆ්‍රැන්සිස් බේකන් තර්ක කළේ ඇයි?

   (ඇ) සමාජ විද්‍යා පර්යේෂණ තුළ අනුභූතවාදී විධික්‍රම භාවිතා කරන පර්යේෂකයන්ගේ ඥාන මීමංසාත්මක ස්ථාවරය කුමක්ද?

( අ. පි. බ.)

4. (අ) "නූතන විද්‍යාව තාර්කිකව (scientific rationality) උසස් ය යන ප්‍රවාදය ප්‍රශ්න කළ පෝල් ෆෙයරාබන්ඩ් ඒ වෙනුවට ක්‍රමවේදාත්මක අරාජකත්වය (methodological anarchism) යෝජනා කළේ ය". සාකච්ඡා කරන්න.

   (ආ) ඉම්රි ලකාටොස්ගේ විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන (Scientific Research Programme) පහදන්න.

5. (අ) යථාර්ථය සහ ඥානයේ විද්‍යාත්මක බව (scientificity of knowledge) සම්බන්ධ මාක්ස්වාදී ප්‍රවේශය කුමක් ද?

   (ආ) මාක්ස්වාදී සහ ප්‍රත්‍යක්ෂමූලවාදී (positivist) ඥාන මීමංසා (epistemologies) අතර සමානතා සහ වෙනස්කම් දක්වන්න.

6. පහත සංකල්ප අතරින් තුනක් කෙටියෙන් පහදන්න:
   (අ) තෝමස් කුන්ගේ පැරඩයිම (paradigm) පිළිබඳ සංකල්පය
   (ආ) අල්තුසර්ගේ symptomatic reading සංකල්පය
   (ඇ) ඔගස්ට් කොම්ට් (August Comte) සහ ප්‍රත්‍යක්ෂමූලවාදය (Positivism)
   (ඈ) දේශපාලන විද්‍යා පර්යේෂණවලට ආනුභවිකවාදයෙන් ඇති වූ බලපෑම
   (ඉ) ප්‍රපංචවේදය (Phenomenology) හා මානවවංශ ලේඛනය (Ethnomethodology)

**********************